**ශීර්ෂය 416 - දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් අඩංගු සම්පිණ්ඩන වාර්තාව 2021 අගෝස්තු 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

මෙම අමාත්‍යාංශය 2020 වර්ෂයේදී ආරම්භකර ඇති හෙයින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමේ අවශ්‍යතාවයක් නොවීය.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

## 2.1 වියදම් කළමනාකරණය

----------------------------

මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව පහතින් දැක්වෙන නිරීක්ෂණවලට අනුව තහවුරු විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් දෙකක් සඳහා සලසන ලද රු.250,000 ක සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. | 2020 අගෝස්තු 31 දින දක්වා වැය ශීර්ෂය යටතේ පැවති වැය විෂයයන් 18 ක් මඟින් වැය කර තිබෙන රු.38,999,218 ක වියදම අමාත්‍යාංශ දෙකෙහි එකඟතාවයන් මත මාරු පත්‍රයක් මඟින් නව රාජ්‍ය අමාත්‍යාංශයේ වියදම් ලෙස ගිණුම් ගත කර ඇති බව. | ආයතනයේ දැක්ම හා මෙහෙවර අනුව සකස් කරන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වන ක්‍රියාකාරකම් සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත පුනරාවර්තන වැය විෂයන් 4 ක් සඳහා සලසා තිබුණු රු.8,650,000 ක් වූ ප්‍රතිපාදන රු.10,927,850 ක් දක්වාද, මූලධන වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.500,000 ක් වූ ප්‍රතිපාදන රු.900,000 ක් දක්වාද මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් මගින් වැඩි කරගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කළ බව හා එසේ ප්‍රතිපාදන මාරු කර ගැනීමට හේතු දක්වා ඇති බව. | -එම- |
| (ඇ) | මූලධන වැය විෂයයන් 04 ක් සඳහා සලසාගෙන තිබුණු රු.8,100,000 ක ප්‍රතිපාදනවලින් සියයට 55 ක් එනම් රු.4,438,112 ක් අරමුණුගත කාර්යය සඳහා වැය කර නොතිබීමෙන් ඉතිරිව තිබුණු අතර එක් එක් වැය විෂයයන්හි ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 26 සිට සියයට 98 දක්වා වූ පරාසයක පැවතුණි. පුනරාවර්තන වැය විෂයයන් 06 ක් සඳහා සලසාගෙන තිබුණු රු.9,450,000 ක ප්‍රතිපාදනවලින් සියයට 34 ක් එනම් රු.3,250,095 ක් අරමුණුගත කාර්යය සඳහා වැය කර නොතිබීමෙන් ඉතිරිව තිබුණු අතර එක් එක් වැය විෂයයන්හි ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 29 සිට සියයට 62 දක්වා වූ පරාසයක පැවතුණි. | ප්‍රතිපාදන ඉතිරිවීම්වලට හේතු දක්වා ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍ය කාර්යාලයේ වැටුප් හා වේතන සඳහා ප්‍රතිපාදනය රු.4,700,000 ක් වූ අතර අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා රු.3,875,000 ක් හෙවත් වැටුප් හා වේතනවලින් සියයට 82 කට සමාන ප්‍රතිපාදන සලසා තිබුණි. | 2020 අගෝස්තු 31 දින දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් දරන ලද වියදම ද ආවරණය කර ගැනීමට හැකිවන පරිදි වැටුප් හා වේතන හා අතිකාල හා නිවාඩු දින වැටුප් ඇතුළු අනෙකුත් වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන සලසා දී ඇති බව. | -එම- |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94 (1) හි දැක්වෙන විධිවිධාන වලට පටහැනිව, පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 05 ක රු.136,153 ක් වූ ඉතිරිවීම් ඉක්මවා රු.2,837,253 ක බැරකම් වලට බැඳී තිබුණු අතර 2020 වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු වැය විෂයන් 02 ක 2020 දෙසැම්බර් 31 දිනට රු.84,992 ක බැරකම්වලට එළඹ තිබුණි. | 2020 වර්ෂය සඳහා අතුරු සම්මත ගිණුම් මගින් ලබාදුන් ප්‍රතිපාදන බැරකම් නිරවුල් කිරීමට ප්‍රමාණවත් නොවූ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාන මාරුවී ගොස් වර්ෂ 5 ඉක්මවූ නිලධාරියකුගෙන් අයවිය යුතු රු.288,618 ක් ද, සේවය අතහැර ගොස් වර්ෂ 1 ත් වර්ෂ 2 ත් අතර කාලයක් ගතවූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.297,095 ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි. | රු.288,618 ක මුදල අය වී ඇති නමුත් ස්ථාන මාරුව ගිය සේවා ස්ථානය විසින් ගිණුම් නිරවුල් නොකිරීම මත ශේෂය ඉතිරිවී ඇති බව හා එය කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගන්නා බව. | ස්ථාන මාරුවීම හෝ සේවය අවසන් කිරීම සිදුවන අවස්ථාවේදීම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 891(1) | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනය යාවත්කාලින කර පවත්වා නොතිබුණි. | රජයේ නිලධාරීන්ගේ ඇප ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනය යාවත්කාලින කර පවත්වා ගත යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 110 | මුදල් රෙගුලාසියෙහි සඳහන් ආකෘතිය ප්‍රකාරව හානි හා පාඩු ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර පිළියෙල කර තිබුණු හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි 110 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව හානි හා පාඩු ලේඛනය පවත්වා ගත යුතුය. |
| | (iii) මුදල් රෙගුලාසි 1646 | වාහන භාර නිලධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ගමන් බිමන් පිළිබඳ මාසික සාරාංශ මේ වන විට පරීක්ෂා කරමින් පවතින බව හා ඉදිරි කාලයේදී සෑම මසකම නියමිත දිනට ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | රාජ්‍ය අමාත්‍යාංශය සතු වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | 2021 වර්ෂයේදී සිදු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුය. |

**2.5 ගණකාධිකාරී නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| **නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව, අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය කර, ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. යහපාලනය**

**3.1 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු වාහන ලැයිස්තුව තුළ වාහනවල පිරිවැය සඳහන්ව නොතිබුණු අතර එම ලැයිස්තුවේ ඇතුළත්ව තිබුණු මෝටර් බයිසිකල් 48 ක, අමාත්‍ය කාර්ය මණ්ඩලය පරිහරණය කරන වාහන 06 ක සහ අපහරණය සඳහා වෙන්කරන ලද වාහනයක පිරිවැය අනාවරණය කර නොතිබුණි. තවද පිරිවැය රු.214,314,951 ක්වූ මූල්‍ය නොවන වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කර ගෙන නොතිබුණි. | වාහනවල පිරිවැය සහිත වත්කම් ලේඛනයක් පිළියෙල කරමින් පවතින බව, යතුරුපැදි 48 ඔසුගොවි ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන ඇති බව හා සී/ස ඔසුගොවි සමාගම ඈවර කිරීමට සූදානම්ව යතුරුපැදි ලියාපදිංචි සහතික අමාත්‍යාංශය වෙත එවා ඇති නමුත් වත්කම් වටිනාකම පිළිබඳව විස්තර ඉදිරිපත් කර නැති බැවින් ඉදිරියේදී පත් කරනු ලබන කමිටුවක් මඟින් වටිනාකම් තක්සේරු කිරීමට කටයුතු කරන බව, අමාත්‍ය කාර්ය මණ්ඩල වාහනවල අයිතිය මෙම රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා නොමැති බව, අපහරණය සඳහා ලබාදී තිබුණු වෑන් රථය තාවකාලිකව පරිහරණයට ලබා දුන් වාහනයක් වන බව හා එහි අයිතිය පවරා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | රාජ්‍ය අමාත්‍යාංශය සතු සියලුම වාහනවල පිරිවැය ගිණුම්ගත කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 403 ක් වුවද, එදිනට තථ්‍ය කාර්යය මණ්ඩලය 289 ක් වූයෙන් අනුමත කාර්යය මණ්ඩලයෙන් සියයට 28 කට සමාන පුරප්පාඩු සංඛ්‍යාව 114 ක් විය. එම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සියයට 27 ක්ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු සියයට 25 ක්ද, ද්විතීය මට්ටමේ පුරප්පාඩු සියයට 29 ක්ද සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සියයට 17 ක්ද විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් හා ද්විතික මට්ටමේ තනතුරු 106 ක් පුරප්පාඩුව පැවතීම තුළින් රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යසාධන ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි බලපෑමක් සිදුවිය හැකි බව නිරීක්ෂණය විය. | මෙම තනතුරු පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇති බව හා ද්විතීය මට්ටමේ සංවර්ධන නිලධාරී සේවයේ පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමට එම අමාත්‍යාංශය මඟින් කටයුතු කරමින් පවතින බව. | අවශ්‍යතාවය පරිදි පුරප්පාඩු විධිමත් ලෙස පිරවීමට කටයුතු කළ යුතුය. |